# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2016

2022 දෙසැම්බර් - 2023 මාර්තු

### මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ දර්ශනය (නව/පැරණි නිර්දේශය)

**බෞද්ධ සමාජ දර්ශනය, පාරභෞතික ප්‍රස්තුත හා සමයාන්තර චින්තා BUPH – E 2025**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. බුද්ධකාලීන භාරතීය සමාජය ආගමික මතවාද කරණකොට ගෙන පීඩාවට පත්ව සිටි ආකාරය පැහැදිලි කරන්න.

02. සාර්ථක ගෘහස්ථ ජීවිතයකට අවශ්‍ය ආර්ථික සමෘද්ධිය ගොඩනගා ගැනීමෙහි ලා ප්‍රමාණවත් උපදෙස් බෞද්ධ ඉගැන්වීම් තුළ අන්තර්ගත දැයි පරීක්ෂා කරන්න.

03. සමාජ ප්‍රගතිය හුදෙක් ආර්ථික සාධක මත පමණක් පදනම් නොවන බව බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් පැහැදිලි කරන්න.

04. පුද්ගලයා වෙත පැවරෙන යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටුකිරීමෙන් සුරක්ෂිත සමාජයක් නිර්මාණය කරගත හැකි අයුරු බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් විශද කරන්න.

05. යහපත් පාලන තන්ත්‍රයක් බිහිකර ගැනීමෙහි ලා පාලක - පාලිත දෙපක්ෂයම සිය කාර්යභාරය නිසි අයුරින් ඉටුකළ යුතු අයුරු බෞද්ධ ඉගැන්වීම් පාදක කොට ගනිමින් විමර්ශනය කරන්න.

06. 'අපරාධ මර්දනයෙහිලා නීතිගරුකවීම මෙන්ම නීති උල්ලංඝනය කරන්නන්ට දඬුවම් දීමද අත්‍යවශ්‍ය සාධකයකි.' බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් විශද කරන්න.

07. ගිහි - පැවිදි සබඳතාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් එම දෙපක්ෂයේම පුරුෂාර්ථ සාධනයෙහිලා ඉවහල් වන අයුරු පරීක්ෂා කරන්න.

08. පාරභෞතික ප්‍රස්තුත යනු මොනවාදැයි හඳුන්වා බෞද්ධ ඉගැන්වීම්වලින් ඒවාට ලැබෙන ප්‍රතිචාරය කෙබඳු දැයි පැහැදිලි කරන්න.

09. බෞද්ධ කර්මවාදය නියතිවාදයක් නොවන අයුරු පැහැදිලි කරන්න.

10. බුදුදහම ආත්මවාදය ප්‍රතික්ෂේප කරන්නේ කවර පදනමකින් දැයි පාලි සූත්‍රාගත ඉගැන්වීම් ඇසුරෙන් ප්‍රකට කරන්න.

*********************************